<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>

<u>නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය</u>

<u>ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර අධ්‍යක්ෂ (නගර නිර්මාණ) III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2023</u>

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර අධ්‍යක්ෂ (නගර නිර්මාණ) III ශ්‍රේණියේ තනතුරෙහි පවතින පුරප්පාඩු 12 ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් රාජ්‍ය සේවයේ නිරතව සිටින නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර පහත සඳහන් දිනට හෝ ඊට පෙර, අධ්‍යක්ෂ ජනරාල්,ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව,5වන මහල,සෙත්සිරිපාය,I අදියර,බත්තරමුල්ල වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.කවරයේ වම් පස උඩ කෙළවරේ “විධායක සේවා ගණයේ සහකාර අධ්‍යක්ෂ (නගර නිර්මාණ) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2023 ” යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද, විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය.

(අ) අයදුම්පත්‍ර කැඳවන අවසාන දිනය 2024.05.03 දින වේ

අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරාගත යුතුය.

**සටහන :** අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරාගත යුතුය.

## 1. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:

ලිඛිත විභාගයේදී සියලු විෂයයන් සමත් අයදුම්කරුවන් අතරින් විභාගයේදී ලබාගත් ලකුණුවල එකතුවේ කුසලතාවයේ අනුපිළිවල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම්ලත් අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

## 2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු /වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

III. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ / රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි ඇතුළත් කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වේ.

## 3. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ 03/2016 දරණ වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2016,රු.47,615-10×1335-8×1630-17×2170-රු.110,895/= ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වෙයි.

## 4. අධ්‍යාපන සුදුසුකම් :

අදාළ නොවේ.

## 5. වෘත්තීය සුදුසුකම් :

අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

## 6. පළපුරුද්ද:

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රධානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්,

I. නගර හා ග්‍රාම නිර්මාණය පිළිබඳ උපාධියක්

හෝ

II. නගර හා ග්‍රාම නිර්මාණය පිළිබඳ පශ්චාත් උපාධියක්

හෝ

III. ඕනෑම උපාධියක් සමග නගර හා ග්‍රාම නිර්මාණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම

සහ

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක හෝ සංවර්ධන සහකාර තනතුරක හෝ භෞතික සැලසුම් සහකාර තනතුරක හෝ ආශ්‍රිත සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර (05)ක පළපුරුද්දක් සහිත නිලධාරියෙකු වීම.

හෝ

(ආ) ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ/ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ සැලසුම් කාර්යාල සහකාර/ සැලසුම් ශිල්පි/ ප්‍රධාන පරීක්ෂක හෝ පරීක්ෂක (ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ) තනතුරක වසර 10 ක පළපුරුද්දක් සහිත අයකු වීම සහ ඉන් වසර පහ (05) ක් පළමුවන පන්තියේ / අධි ශ්‍රේණියේ නිලධරයකු ලෙස සේවය කර තිබීම.

සටහන : උපාධිය/ පශ්චාත් උපාධිය/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය බලපවත්නා දිනය අයදුම්පත් කැඳවන අවසාන දිනය හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

**7. වයස් සීමාව :**

අදාළ නොවේ.

**8. කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**9. වෙනත් සුදුසුකම් :**

I. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට එනම් 2024.05.03 දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

II. තනතුරේ ස්ථිර කර තිබීම.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10.

**10.1 ලිඛිත විභාගය :**

10.1.1 මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලැබේ.

10.1.2 විභාගය පිළිබඳ විස්තර :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්නපත්‍ර තුන (03) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂයය සමත්වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.
අපේක්ෂකයින් සියලුම ප්‍රශ්නපත්‍රවලට පෙනී සිටිය යුතු ය.

| අංකය | විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01 | සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |
| 02 | අභියෝග්‍යතාවය | පැය 01 | 100 | 40% |
| 03 | නගර නිර්මාණ විෂය ආශ්‍රිත කාලීන දැනුම | පැය 02 | 100 | 40% |

10.1.3 **විභාගය සඳහා විෂය නිර්දේශය**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| I සාමාන්‍ය දැනීම | ජාතික කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප පරිසරය තුළ පවතින සාමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාල සාධකයන් සම්බන්ධව පවතින දැනුම සහ අවබෝධය. |
| II අභියෝග්‍යතාවය | පදගත, සංඛ්‍යාත්මක හා රූපාක්ෂර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ නිගමනයන් හා ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම. |
| III නගර නිර්මාණ විෂය ආශ්‍රිත කාලීන දැනුම | 1. 1946 අංක 13 දරණ නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ විධිවිධාන සහ 2000 අංක 49 දරණ සංශෝධිත නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ කාර්යයන්.<br>2. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ විෂය පථය සහ එයින් අපේක්ෂිත අරමුණු.<br>3. ජාතික භෞතික සැලසුම් සභාවේ සංයුතිය හා එයින් අපේක්ෂිත පරමාර්ථ.<br>4. ජාතික භෞතික සැලසුම් සභාවේ බලතල හා සැලසුම් ක්‍රියාත්මක කිරීමට එයින් ලබා ගත හැකි සහාය.<br>5. අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවේ සංයුතිය හා |

| | |
|---|---|
| | එයින් අපේක්ෂිත ප්‍රතිඵල.<br>6. අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවේ කාර්යභාරය හා සැලසුම් ක්‍රියාත්මක කිරීමට එයින් ලබා ගත හැකි සහාය.<br>7. තාක්ෂණ උපදේශන කමිටුවේ සංයුතිය හා කාර්යභාරය.<br>8. නාගරික සංවර්ධන අධිකාරි පනත.<br>9. මධ්‍යම පරිසර අධිකාරි පනත.<br>10. මහා නගර සභා අඥා පනත.<br>11. නගර සභා අඥා පනත.<br>12. ප්‍රාදේශිය සභා පනත.<br>13. පළාත් සභා පනත.<br>14. ඉඩම් අත්පත් කර ගැනීමේ පනත.<br>15. නිවාස හා නගර වැඩිදියුණු කිරීමේ අඥා පනත.<br>16. නගර නිර්මාණයන්ට අදාළ වෙනත් නීති.<br>17. නගර නිර්මාණයේ වත්මන් ප්‍රවණතාවයන්, නාගරීකරණය, හා බැඳුණු ගැටළු හා පරිසර ගැටළු පිළිබඳ දැනුම. |

### 10.I.4 **ප්‍රතිඵල නිකුත් කිරිම :**

ලිඛිත පරීක්ෂණයට පෙනී සිට සුදුසුකම් ලැබූ අපේක්ෂකයින්ගේ කුසලතා අනුපිළිවෙලට සකස් කළ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දැනුම් දීම පරිදි නියම කරන ලද ලකුණු සීමාවකට ඉහළින් මුළු ලකුණු ලැබූ අපේක්ෂකයින්ගේ නම් ඇතුලත් ප්‍රතිඵල ලේඛනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලබා දෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.slida.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

## 10.2. සම්මුඛ පරීක්ෂණය :

### 10.2.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත විභාගයේදී සියලු විෂයයන් සමත් අයදුම්කරුවන් අතරින් විභාගයේදී ලබා ගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතා ඇගයිමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම්ලත් අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් යෝග්‍යතා ඇගයිමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

| **පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ** | | **උපරිම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| **1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්**<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදාන ආයතනයකින් ලබා ගත් නගර නිර්මාණ හෝ භෞතික සැලසුම් ක්ෂේත්‍රයේ,<br>I. පශ්චාත් උපාධිය<br>II. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br>III. උපාධිය<br>සටහන I : මෙම නිවේදනයේ 6 වගන්තියේ සඳහන් සේවයකට/ තනතුරකට පත් කිරීමේ දී හෝ දැනට අයත් සේවයේ/ දරන තනතුරෙහි කාර්යක්ෂමතා කඩඉමකින්/ දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත් කිරීමට හෝ උසස් කිරීමකදී සුදුසුකමක් ලෙස දැනටමත් සලකා ඇති සුදුසුකම් සඳහා ලකුණු ලබා නොදෙනු ඇත.<br>සටහන II : ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු පිරිනැමේ. | <br><br><br><br>25<br>20<br>15 | 25 |
| **2. වෘත්තීය සුදුසුකම්**<br>ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයෙහි සාමාජිකත්වය ලබා තිබීම. (වරලත් නගර නිර්මාණ ශිල්පී) | | 25 |
| **3. අතිරේක පළපුරුද්ද**<br>ඉහත (6)හි පළපුරුද්ද යටතේ සඳහන් මූලික සුදුසුකම සම්පූර්ණ කල දින සිට අයදුම්පත් කැඳවීමේ අවසන් | | 25 |

| | | |
|---|---|---|
| දිනය දක්වා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 හා 01/2019(I) අනුව ලකුණු ලබා දෙනු ලැබේ. | | |
| **4. භාෂා ප්‍රාගුණ්‍යය**<br>(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයක් ලෙස ඇතුලත් ව උපාධියක් ලබා තිබීම.<br>(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ගත් SLQF3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින් /රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500ක පාඨමාලාවක් හදාරා ඉංග්‍රීසි භාෂාව සඳහා ඩිප්ලෝමාවක් ලබා තිබීම.<br>(ඇ) අධ්‍යන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී හෝ EDEXCEL හෝ CAMBRIDGE උසස්පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර දෙකක් ඇතුලත IELTS සමස්ථ ලකුණ 6.5 (සෑම විශයකටම අවම ලකුණු 06ක් සහිතව) හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ ලබා තිබීම<br>(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදනකොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ගත් SLQF 2 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br>සටහන:- ඉහත සඳහන් නිර්ණායක යටතේ ලකුණු ලබා දෙනු ලබන්නේ ඉහළම සුදුසුකම් සඳහා පමණි. | 10<br>7.5<br>06<br>05 | 10 |
| **5. පරිගණක දැනුම**<br>නගර නිර්මාණ හෝ භෞතික සැලසුම් හෝ භූගෝලිය තොරතුරු පද්ධති පිළිබඳ පරිගණක පද්ධති/ යෙදවුම් පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ | | 10 |

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුවකින්/ පුහුණු ආයතනයකින් ලබා ගත්,<br>• ඩිප්ලෝමා හෝ ඊට ඉහළ සුදුසුකමක් (ඩිප්ලෝමා පාඨමාලාව පැය 720 හෝ මාස 06 කට නොඅඩු විය යුතුය)<br>• සහතික පත්‍ර (පුහුණුව/ පාඨමාලාව පැය 360 හෝ මාස 03 කට නොඅඩු විය යුතුය.)<br>• සහතික පත්‍ර (පුහුණුව පැය 360 කට අඩු) | 10<br>07<br>04 | |
| **සටහන**<br>ඉහත සඳහන් නිර්ණායක යටතේ ලකුණු ලබා දෙනු ලබන්නේ ඉහළම සුදුසුකම් සඳහා පමණි. | | |
| **6. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br>• නායකත්ව හා සන්නිවේදන කුසලතා<br>• ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා පිළිබඳ දැනුම<br>• වෘත්තිය ආකල්ප | 02<br>02<br>01 | 05 |
| **එකතුව** | | **100** |

**11 විභාග කොන්දේසි**

i. විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්නපත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතුය.

ii. විභාග ගාස්තුව රු.1,000 කි. විභාග ගාස්තුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක 7042731 දරණ ලංකා බැංකු බත්තරමුල්ල ශාඛාවට බැරවන ලෙස ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට මුදලින් ගෙවීම් සිදු කළ යුතු අතර රිසිට් පතෙහි ඇඳුණුම්පත් අංකය සමඟ තේක අංකය ADR (01) ලෙස සඳහන් කළ යුතු ය.අයදුම්කරුගේ නමින් ම ලබා ගන්නා ලදු පතෙහි දාරයක් මගින් අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.එම කුවිතාන්සියෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

iii. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

iv. අසම්පූර්ණ අයදුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන:- ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කර ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

නිවේදනයෙහි සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

v. අයදුම්පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, 1.0 සිට 2.12 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද 3.0 සිට 3.2.V වන තෙක් ශීර්ෂ 02වන පිටුවට ද ඉතිරිය 03 , 04 පිටුවලට ද වන ලෙස ගෙන සකස් කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කල යුතුය. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

vi. අයදුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම පුවත්පත්වල නිවේදනයක් පළ කරනු ලැබේ. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පතෙහි ඡායා පිටපතක් ද ලියාපදිංචි කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන නිවේදනයක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

vii. විභාගය පවත්වන දිනය පසුව දැනුම් දෙනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

viii. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

ix. **අපේක්ෂකයාගේ අනන්‍යතාවය :**

විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් ඕනෑම ලේඛනයක් පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

iii. වලංගු රියදුරු බලපත්‍රය

සැලකිය යුතුය :

අ. අයදුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

ආ. සම්මුඛ පරීක්ෂණයේදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ,සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම් කරුවෙකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වෙයි. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම් කරුවෙකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කරවා ගත යුතුය.

**12. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුව හොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබෙයි.එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුව හොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**13.** පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වෙයි.

**14.** මෙම ගැසට් නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූල තාවයක් ඇති වුව හොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

..............................................................

ලේකම්,

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

2025......අගෝස්තු.....මස......08.......දින